(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 173.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026** අගෝස්තු **18** අඟහරුවාදා පූ. භා. **9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ බලශක්ති අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **එම්.කේ.එම්. අස්ලම් මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **කේ. ඉලංකුමාරන් මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගරු **ඕෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු කුමාර ජයකොඩි මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු තාහිර් මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2026 අගෝස්තු 18 දින 'සත්ව (සංශෝධන)' සහ 'ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2026 ජුලි 07 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXXI කොටස; සහ

(ii) 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ II කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 34 වගන්තිය ප්‍රකාරව, ජාතික විගණන කාර්යාලය විසින් සකස් කරන ලදුව, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2027 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් —

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

ඉදිරිපත් කර, එම නියෝග ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2016/2017 සහ 2017/2018 වර්ෂ සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තා;

(ii) 2023/2024 වර්ෂය සඳහා බී සී සී ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව; සහ

(iii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024/2025 වර්ෂය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් —

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ දකුණු පළාත් සභාව සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ උතුරු පළාත් සභාව සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කම්කරු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් —

(i) 2025 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2025 වර්ෂය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් —

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන දෙකක් සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන දෙකක් සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(17) නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2025 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති වෙනුවෙන්, එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී, ගරු රවී කරුණානායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2026 ජූලි 10 දිනැති අංක 2496/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(ii) 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වගන්තිය යටතේ යෝජනා සම්මතය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් එම කාරක සභාව විසින් 'ශ්‍රී ලංකාවේ කාබනික හා රසායනික පොහොර වර්ග භාවිතය සහ ගොවි ජනතාවට පොහොර ලබාදෙන ක්‍රමවේදය' සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී, ගරු සංජීව රණසිංහ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 සහ 2024 වර්ෂ සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තා;

(iii) 2018, 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iv) 2020/2021, 2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තා; සහ

(v) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) බලංගොඩ, තලංගම, යක්එරමුදුකැටිය යන ලිපිනයෙහි පදිංචි අයි.ජී. සුමනලතා මහත්මියගෙන් ලැබුණු 2025.09.11 දිනැති පෙත්සම ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) වඳුරඹ, කොකාවල, වරකපිටි කන්ද යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. සිරියාවතී මහත්මියගෙන් ලැබුණු 2025.07.22 දිනැති පෙත්සම ගරු තිලංක යූ. ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) වස්කඩුව, දෙදියවල, පාසල පාර, අංක 207 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජේ.එච්.ඩී. ෂොක්මන් මහතාගෙන් ලැබුණු 2025.08.25 දිනැති පෙත්සම; සහ

(ii) මහගම, කුයිල්කාවත්ත යන ලිපිනයෙහි පදිංචි එස්. සිවකුමාරි මහත්මියගෙන් ලැබුණු 2025.12.15 දිනැති පෙත්සම

ගරු නන්දන පත්මකුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) නිට්ටඹුව, මාඉඹුල, අංක 198 දරන ස්ථානයෙහි පදිංචි වී.ඩබ්ලිව්. අභයසුන්දර මහතා සහ තවත් තිස්නව දෙනෙකුගෙන් ලැබුණු 2025.07.28 දිනැති පෙත්සම ගරු රුවන් මාපලගම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) වවුනියාව, නේරියකුලම, මාන්කුලම යන ලිපිනයෙහි පදිංචි එම්.පී. ආකිලා උම්මා මහත්මියගෙන් ලැබුණු 2025.12.23 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය:** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 සැප්තැම්බර් 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. අධිකරණ සංවිධාන (සංශෝධන):** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2026 සැප්තැම්බර් 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූලි 10 දිනැති අංක 2496/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අ.භා. 12.08 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.39 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

“ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.50 ට ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.59 ට ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.43 ට ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතායවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**9. කල් තැබීම (දේශීය වෛද්‍ය උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබූයෙන්, අ.භා. 6.20 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 අගෝස්තු 19 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.